# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1552/20 - 2008 ජුනි 05 වැනි බ්‍රහස්පතින්දා - 2008.06.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකයඃ ඌආ/10/04.

### ඌව පළාත් සභාවේ පත්කිරීම්

ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ එච්. එම්. සෝමතිලක මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

2. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ජී. ඩබ්ලිව්. සී. ප්‍රියභාෂිණී මහත්මිය තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බදුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට,

3. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II වන පන්තියේ ඩී. එම්. කේ. එස්. දිසානායක මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.01.01 දින සිට ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ වැඩ බැලීමට,

4. පරිපාලන නිලධාරිණී පී. ඩබ්ලිව්. සී. පී. දයාරත්න මහත්මිය තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.02.17 දින සිට 2008.03.01 දින දක්වා කාලය සඳහා ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) තනතුරේ රාජකාරි ඉටු කිරීමට,

5. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ එන්. සී. හෙන්නායක මහත්මිය තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.03.10 දින සිට ලේකම්, එම්. ඒ. බී. දයාසෙනරත් මහතා නැවත සේවයට වාර්තා කරන තෙක් ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක අමාත්‍යාංශ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

6. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I වන පන්තියේ එස්. ජී. ගමගේ මහතා 2008.03.17 දින සිට ඌව පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පුහුණු) වශයෙන්,

7. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ඩී. එස්. අමරසිංහ මහතා 2008.03.19 දින සිට ඌව පළාත් සභාවේ සභා ලේකම් වශයෙන්,

8. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ සුමිත් සුරවීර මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.03.20 දින සිට 2008.04.20 දින දක්වා ඌව පළාත් සභාවේ ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන අමාත්‍යාංශ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

1A - PG 000913 — 480 (2008/06)

**9.** ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ජී. කේ. එස්. එල්. රාජදාස මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.03.24 දින සිට 2008.04.04 දින දක්වා කාලයට ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක අමාත්‍යාංශ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

**10.** ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ සුමිත් සුරවීර මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.04.24 දින සිට 2008.05.06 දින දක්වා ඌව පළාත් සභාවේ සභා ලේකම් තනතුරේ වැඩ බැලීමට,

**11.** ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ඒ. ඊ. එන්. දීපානී මහත්මිය තම නිත්‍ය තනතුරට අතිරේකව 2008.03.03 දින සිට 2008.03.14 දින දක්වා කාලය සඳහා බදුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

බදුල්ල, රජවීදියේ
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

06 - 393

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.